# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,486—1965 අගෝස්තු 20 වැනි සිකුරාදා—1965.8.20**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 605 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන | — |
| තනතුරු—ඇබෑර්තු | 607 | අය-වැය ලේඛන | 614 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — | දේපළ විකිණීම | — |
| අතුරු ව්‍යවස්ථා | 612 | මාර්ග කොමිටි දැන්වීම | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යට තේ දැන්වීම | 614 | විවිධ දැන්වීම | 617 |


## පළාත් පාලන නිවේදන

එල්.ඕ—බී. 69/41.

ප.පා.දෙ—ජී.බී.—2/1/33.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමැති මුරුගේසන් තිරුවෙල්වම් වන මම ගාලු දිස්ත්‍රික්කයේ ඉඳුරුව ගම්ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ගම් ප්‍රදේශයේ ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 ජූලි මස 29 වැනි දින,
කොළඹ දීය.

8–771—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඕ. —බී. 69-41

ප. පා. දෙ.—ජී.ඊ. 1/1/37

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුවෙල්වම් වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ යටිගහ පත්තුවේ කොටදෙණියාව ගම් ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ප්‍රදේශයෙහි ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 ජූලි මස 8 වැනි දින,
කොළඹ දී ය.

8–780—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

### විශෙෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපළාත ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට යටිනුවර ගඟපළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වෙනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

පී. බී. දිසානායක,
යටිනුවර ගඟපළාත ගම්සභාවේ
ප්‍රධාන තැන.

1965 ක්වූ අගෝස්තු මස 3 වැනි දින,
යටිනුවර ගඟපළාත ගම්සභා කාර්යාලයේ දීය.

8–782—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## "(261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත"

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ එගොඩපත පත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින, අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩ මේ යෝජනව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කරගැනීමට කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළයේ එගොඩපත පත්තු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩී. ඕ. වී. විජේමාන්න,
දෙහිගම්පල් කෝරලේ එගොඩපතපත්තු ගම්සභාවේ
සභාපතිතැන.

1965. 7. 5 වැනි දින,
ඉඹුලාන ගම්සභා කායසීලයේදීය.

8-784—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### 13 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 දරන ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, බටහිර දිසාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්, ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස් වන මම කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක-වග ගම්සභාවේ අංක 13 දරන කොටසේ නියෝජිත, ධර්මදාස නලීන කීර්ති වැලිකල මහතා, සභාවට දැන්වීමක් නොමැතිව, පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු නොපැමිණීම ගැන සෑහීමකට පත්ව, කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක-වග ගම්සභාවේ අංක 13 දරන කොටසේ නියෝජිත, ධර්මදාස නලීන කීර්ති වැලිකල මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශකරමි.

ඩබ්ලිව්. ඊ. වී. ඇස්. ද අල්විස්,
බටහිර දිසාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 4, පළාත් පාලන දෙපාර්තමේන්තුවේදීය.

8–775—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥ පණත

### 13 වැනි වගන්ති යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලයේ ප්‍රකාර, ඌව කොට්ඨාශයේ පලාත් පාලන සහකාර කොමසාරිස්, මුතු බණ්ඩාර සමරකෝන් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොල ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයේ සභික ඊ. එම්. ඩබ්ලිව්. ගවරම්මාන මහතා පිළිවෙලින් පැවැත්වුනු ගම්සභා රැස්වීම් තුනකට වැඩි ගණනකට සභාවට දැනුම් දීමක් නොකර නොපැමිණි බව ගැන සෑහීමට පත්වී, බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොල ගම්සභාවේ අංක 11 දරණ කොට්ඨාශයේ සභික ඊ. එම්. ඩබ්ලෳ ගවරම්මාන මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට තම සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. බී. සමරකෝන්,
ඌවේ පලාත් පාලන සහකාර කොමසාරිස්.

1965. 8. 6 දින බදුල්ලේදීය.

8–785—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ මාළිම්බඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXXVIII වන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මාළිම්බඩ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

හෙන්රි ඇලස්,
මාළිම්බඩ ගම්සභාවේ සභාපති තැන.

වර්ෂ 1965 වූ ජූලි මස 14 වැනි දින,
මාළිම්බඩ ගම්සභා කායසීලයේදීය.

8–770—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වාවූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට අරණායක ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ආර්. පී. බණ්ඩා,
අරණායක ගම්සභාවේ සභාපති.

1965 ජූනි මස 14 දින,
අරණායක ගම්සභා කාර්යාලයේදීය.

8–768/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට අරණායක ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ආර්. පී. බණ්ඩා,
අරණායක ගම්සභාවේ සභාපති.

1965 ජූනි මස 14 දින,
අරණායක ගම්සභා කාර්යාලයේදීය.

8–768/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

(619 වැනි පිට බලන්න)

---

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අභිකූත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් දරනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවක යන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම්ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනකට ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය වැඩ පරීක්ෂා කාලය සම්බන්ධී තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්වත්" නියම කරනු ලැබෙයි.

————තනතුර සඳහා වූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස: අවුරුදු——, මාස————, දින————.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමඟ :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### දුරකථන ක්‍රියාකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවරට මාතලේ පළාත් ආණ්ඩු සභාවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 750—42 × 13—රු. 1,296.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස.**—1965.9.7 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාග වලින් සමත් වී සිටිය යුත් තාග :—

(i) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය/ගණිතය යන විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ

(ii) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය/ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි අවසාථා ගණනකදී සමත් පොදු අධ්‍යයන (සාමාන්‍ය) සහතික පත්‍රය.

(iii) අයදුම්කරුවන්ට දුරකථන ක්‍රියාකරුවෙකු ලෙස අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි. අධ්‍යාපන සහතික සහ දුරකථන ක්‍රියාකරුවෙකු ලෙස පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද (මුල් ලිපි නොවේ) ඉදිරිපත් කළයුතුයි. අයදුම් පතේ 8 වෙනි කොටුවෙහි (අධ්‍යාපන සුදුසුකම්) සම්මාන සාමාර්ථ්‍යය ලබා ඇති විෂයයන් සඳහන් කළයුතුයි.

(iv) දෙමළ කථා කිරීමේ දැනුම වාසියක් වේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1965.9.7 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි කොටුවේ විශේෂ සුදුසුකම් යටතේ පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ **පෞද්ගලික නමට නොවේ.**

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු අදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1965 අගෝස්තු මස 14 වැනි දින දීය.

8-765—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—අපරැක්ක-බඹරැන්ද ගම් සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :** වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රු. 804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස :** 1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත් තාග.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට හෝ ඊට පළමු අපරැක්ක-බඹරැන්ද ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

[illegible]. අලහප්පෙරුම,
අපරැක්ක-බඹරැන්ද ගම් සභාවේ සභාපති.

1965 ජූලි මස 30 වැනි දින,
අපරැක්ක-බඹරැන්ද ගම්සභා කාර්යාලයේ දීය.

8-199—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—අම්බන-පිනිකහන ගම්සභාව කහඳූව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—22 × 12—රු. 804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස.**—1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට වයස අවුරුදු 20ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත් තාග.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1965 සැප්තැම්බර් මස 7 වැනි දිනට හෝ ඊට පළමු අම්බන-පිනිකහන ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

සනත් ගුණවර්ධන,
අම්බන-පිනිකහන ගම්සභාවේ සභාපති.

1965 ජූලි මස 6 වැනි දින,
කහඳූවේ අම්බන-පිනිකහන
ගම්සභා කාර්යාලයේදී ය.

8-603—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## කතළුව ගම්සභාව

### ආයුර්වේද බෙහෙත් ශාලා සහායකයෙකුගේ ඇබෑර්තුව

ගාලු දිස්ත්‍රික්කයේ කතළුව ගම්සභාව මගින් අභිනවයෙන් ආරම්භ කරනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවයට, බෙහෙත් ශාලා සහායකයෙකු පත්කරගැනීම සඳහා අයැදුම් පත්‍ර 1965 අගෝස්තු මස 27 වැනි දින පෙරවරු 9.00 දක්වා කතළුව ගම්සභාවේ සභාපතිතුමන් විසින් භාරගනු ලැබේ.

**වාර්ෂික වැටුප :**—රුපියල් 300—30×10—600 ක් වූ වාර්ෂික වැටුපට අමතර වශයෙන් ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ද ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ.

**සුදුසුකම් :**—1. දේශීය වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ වෛද්‍යවරයෙකු යටතේ අඩු ගණනේ පස් අවුරුදු සේවා පුහුණුවක් ඇති, ආයුර්වේදීය සහ රසායනික බෙහෙත් වර්ග මිශ්‍රණය මෙන්ම, කෂායවර්ග සකස්කිරීම පිළිබඳව පුහුණුව ලත්, 1965.8.27 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි, අවම පිරිසෙයින් සිංහල 8 වැන්න සමත් ලාංකිකයන් විය යුතුයි.

2. ඉල්ලුම්කරු යහපත් චරිතයකින් යුක්තවිය යුතු අතර ඔහු හොඳින් හඳුනන පළාතේ පිළිගත් දෙදෙනෙකුගෙන් ලබාගන්නාලද චරිත සහතික පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතුය.

3. ඉල්ලුම්කරු ගම්සභා රෙකුලාසිවල 9 යේ 2 වැනි කොටස යටතට නොවැටෙන අයෙකු විය යුතුයි.

4. ගම්සභා රෙකුලාසිවල 9 යේ 4 වැනි කොටස අනුව ඉල්ලුම්කරු, මුදලකින් හෝ ඇප ඔප්පුවකින් ඇපයක් තැබීමට පුළුවන්කම ඇත්තෙකු විය යුතුයි.

**අයැදුම්පත්‍ර :**—මෙහි පහත සඳහන් කරනු ලබන ආදශී පෝර්මයට අනුකූලව පිළියෙලකරගනු ලබන අයැදුම්පත්‍ර අයැදුම්කරුගේ අත් අකුරින් පුරවා සම්පූර්ණකර, නියමිත වේලාවට මත්තෙන් කතළුව ගම්සභාවේ සභාපතිතුමන් නමට ලැබෙන ලෙස ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි.

මෙයට,
ඇල්. එච්. ඒ. ද සිල්වා,
කතළුව ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 2 වැනිද,
කතළුව ගම්සභා කාර්යාලය,
කතළුව-අහංගම.

ආදශී පෝර්මය

### කතළුව ගම්සභාව

### ආයුර්වේද බෙහෙත් ශාලා සහායක ඇබෑර්තුව සඳහා ඉල්ලුම් පත්‍රය

1. පුරප්පාඩුව ප්‍රසිඩකොට ඇති ගැසට් පත්‍රයේ දිනය හා අංකය : ————.
2. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
3. තැපැල් ලිපිනය :————.
4. අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————.
   අවුරුදු :———, මාස :———, දින :———.
5. උපන් දිනය :————.
   (උප්පැන්නයේ පිටපත් ඇමිණිය යුතුයි.)
6. අධ්‍යාපනික සුදුසුකම් හා අන්තිමට සමත්වූ විභාගය :————
7. ලබාඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් :————.
8. ඉගෙන ගත් පාඨශාලාව, ඉන් අස්වූ දිනය හා පාසැලෙන් අස්වූ දින සිට කරන ලද රක්ෂා :————.
9. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
10. මෑතදී චරිත සහතික ලබාගත් අයගේ නම :————.
    1. ..................................................
    2. ..................................................

ඉහතින් මා විසින් සපයා ඇති සියළු තොරතුරු සත්‍යය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-631—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### අඹගමුව දකුණ ගම්සභාවේ පණිවුඩකරුවකුගේ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—රු. 480—30×4 හා 24×1—රු. 624.

3. **අවශ්‍ය සුදුසුකම්**—

(අ) **වයස :** 1965 සැප්තැම්බර් මස 3 වැනි දිනට අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල හය වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුතුවාත් හැර බයිසිකල් පැදීමේ පුහුණුව ලත් අය විය යුතුයි.

4. පළාත් පාලන බලමණ්ඩලවල සථිර සේවයෙහි සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් නියමිත සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයෙහි තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට සාරානුකූලව පිළියෙලකොට, 1965 සැප්තැම්බර් මස 3 වැනි දිනට හෝ ඊට පළමු අඹගමුව දකුණ ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්ට එවිය යුතුයි.

කේ. කේ. අමරරත්න,
අඹගමුව දකුණ ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 4 වැනි දින,
අඹගමුව දකුණ ගම්සභා කාර්යාලය,
කිරිවන්එළිය, නෝටන්බ්‍රිජ්.

8-427/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—අඹගමුව දකුණ ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 540—30×8—24×1—රු. 804. රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්**—

(අ) **වයස :** 65.9.30 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු, 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල සථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට 65.9.3 වෙනි දිනට හෝ ඊට පළමු අඹගමුව දකුණ ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

කේ. කේ. අමරරත්න,
අඹගමුව දකුණ ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 4 වැනි දින,
අඹගමුව දකුණ ගම්සභා කාර්යාලයේ දීය,
කිරිවන්එළිය, නෝටන්බ්‍රිජ්.

8-427/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී—බී 56/50

## කන්කසන්තුරේ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වැනි වගන්ති යටතේ කන්කසන්තුරේ සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1965 ජූලි මස 29 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1951 අප්‍රේල් 27 වැනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ, 1956 ජනවාරි 27 වැනි දින අංක 10,885 දරන ගැසට් පත්‍රයෙහි, පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් සංශෝධිත බලපත්‍රවලට අදාළ සාමාන්‍ය අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි "අප්‍රසන්න හෝ අන්තරාදායක ව්‍යාපාර" පිළිබඳ විස්තරයේ සඳහන් "හාල් මෝලක් පවත්වාගෙන යාම" යන වචන වෙනුවට "හාල් මෝලක් පවත්වාගෙන යාම, ඇලුමිනියම් භාණ්ඩ සෑදීම, ඇලුමිනියම් තහඩු ගබඩා කිරීම, සිමෙන්ති සෑදීම හෝ ගබඩා කිරීම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

8–776—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.බී.—108/46
ප.පා.දෙ-ජීජේ 19/1/5

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරලේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1965 ජූලි මස 26 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### ගම්බද වෙළෙඳ පොළවල් හා පොළවල්

1. සභාව විසින් පිහිටුවන ලද මානානේ ගම්බද වෙළෙඳ පොළේ සිට සැතපුම් එකක අර්ධ විෂ්කම්භයක් ඇති කවයක් ඇතුළතවූ ප්‍රදේශය ඒ වෙළෙඳාම් පොළේ වෙළෙඳ ප්‍රදේශය වශයෙන් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

2. මානානේ ගම්බද වෙළෙඳ පොළේ යම් කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්නාවූ හෝ පාවිච්චි කරන්නාවූ සෑම තැනැත්තකු විසින්, එසේ ප්‍රයෝජනයට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා, මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් අනුව වූ ගාස්තුවක් ගෙවිය යුතුය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල :—"සභාව" යන්නෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරලේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

#### උපලේඛනය

| | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|
| (1) වෙළෙඳපොළ ගොඩනැගිල්ල තුළ හතරැස් අඩි 50කට වැඩි නොවන කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 0 50 |
| (2) වෙළෙඳපොළ ගොඩනැගිල්ල බිම, එවැනි කඩ කාමරයක්— | |
| (අ) හතරැස් අඩි 30කට වැඩි නොවන විට ... | 0 35 |
| (ආ) හතරැස් අඩි 30කට වැඩි වන එහෙත් හතරැස් අඩි 50කට වැඩි නොවන විට ... | 0 50 |
| (ඇ) හතරැස් අඩි 50කට වැඩි වන එහෙත් අඩි 100කට වැඩි නොවන විට ... | 0 75 |
| (3) වෙළෙඳපොළ සහ පොල බිම හතරැස් අඩි 100කට වැඩි නොවන කඩ කාමරයක්,කඩ බක්කියක් හෝ හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 1 00 |
| (4) එළිමහන් බිම කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා, එවැනි කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණය— | |
| (අ) හතරැස් අඩි 9කට වැඩි නොවන විට ... | 0 05 |
| (ආ) හතරැස් අඩි 9කට වැඩිවන එහෙත් හතරැස් අඩි 25ට වැඩි නොවන විට ... | 0 15 |
| (ඇ) හතරැස් අඩි 25කට වැඩිවන එහෙත් හතරැස් අඩි 50කට වැඩි නොවන විට ... | 0 30 |
| (ඇ) හතරැස් අඩි 50කට වැඩිවන එහෙත් හතරැස් අඩි 100කට වැඩි නොවන විට ... | 0 60 |

8–788—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 16/64

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්තිය යටතේ පැල්මඩුල්ල සුළු නගර සභාව විසින්, පනවා, ඒ ආඥාපනතේ 153 වෙනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කළ අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ජූලි මස 21 වෙනි දින,
කොළඹ දී ය.

1. මේ අතුරු ව්‍යවස්ථා 1964 පැල්මඩුල්ල සුළු නගර සභා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ අතුරු ව්‍යවස්ථා වලංගු වන දිනයට ප්‍රථමයෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ආරම්භ කොට ඇති අවස්ථාවක ඒ දිනයේ සිට එය අවුරුද්දක කාලයක් දක්වා පහත දක්වෙන අතුරු ව්‍යවස්ථා ඒ ප්‍රචාරක දැන්වීම සම්බන්ධයෙන් අදල නො විය යුතු ය.

3. කිසියම් විදියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරවීම, ඒ සම්බන්ධයෙන් නිකුත් කළ අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසියම් තැනැත්තකු විසින් නොකළ යුතු ය.

එසේ වුවද මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත කී විධිවිධාන පහත සඳහන් ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ආලෝකමත් කොට ඇතහොත් හෝ අහස් දැන්වීමක් වෙතොත් මිස, අදළ නොවිය යුතු ය.

(අ) එකතු වන ශුද්ධ ලාභය පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පවත්වනු ලබන විනෝද කටයුත්තකට අදළව කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ආ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කොට තබා ඇති ස්ථානයේ පවත්වනු ලබන විනෝද කටයුත්තකට අදළ යම් දැන්වීමක් ;

(ඇ) රජය මගින් ප්‍රදර්ශනය කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක් ;

(ඈ) ආගමික, දේශපාලන හෝ ප්‍රසිද්ධ රැස්වීම් වලට අදළව කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ;

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක්;

(ඊ) "බදු දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;

(උ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම් වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශවල නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 අගෝස්තු 13 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **මහනුවර දිස්ත්‍රික්කය** |
| | | **පාතදුම්බර පල්ලේගම්පහ ගම් සභාව** |
| 14 | ... | එගොඩහාලියාලේ ගෙදර ජෝන් වීරසේන |
| | | **(තුම්පනේ) ගන් අට පළාත ගම් සභාව** |
| 9 | ... | වත්තේ වලව්වේ රන් බණ්ඩා වැලිවිට |
| | | **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** |
| | | **ඉච්චිලම්පත්තෙයි ගම් සභාව** |
| 6 | ... | මුත්තතම්බි කාලිමුත්තු |

8–763—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශවල නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 අගෝස්තු 13 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **කළුතර දිස්ත්‍රික්කය** |
| | | **මුන්වත්තෙබාගේ පත්තු බටහිර ගම් සභාව** |
| 11 | ... | නාහල්ලගේ කරුණාරත්න |
| | | **යාපනය දිස්ත්‍රික්කය** |
| | | **නල්ලූර් ගම් සභාව** |
| 6 | ... | පී. කුමාරකුලසිංහම් |
| | | **මාතර දිස්ත්‍රික්කය** |
| | | **කන්දපිට-වලකඩ ගම් සභාව** |
| 7 | ... | විජේතුංග ගමගේ ආරියදාස |
| 9 | ... | මොහොට්ටි විල්සන් ඇල්ප්‍රඩ් |
| | | **කුරුණෑගල දිස්ත්‍රික්කය** |
| | | **කුරුණෑගල මහා නගර සභාව** |
| 6 | ... | ආතර් හැමිල්ටන් වීරසිංහ |

8–762—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

### දෙහිවත්ත ගම්සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ දෙහිවත්ත ගම්සභාවේ අංක 6 දරන කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා, රාජපක්ෂ පතිරණගේ ඩිංගිඅප්පුහාමි මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹදී ය.

8–764—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

# අය වැය ලේඛන

## අහංගම සුළු නගර සභාව

**අංක 40 (ii) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයයි**

අනාගත වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරි වී තිබෙන මුදල් පහත සඳහන් අන්දමට යෙදවීමට වර්ෂ 1965 ක්වූ ජූලි මස 30 වැනි දින පවත්වන්නට යෙදුන සභා රැස්වීමේ දී අංක 5 (ආ) දරණ යෝජනා සම්මතයෙන් තීරණය කරන ලදී :—

### I කොටස—සාමාන්‍ය

| ශේෂ වී ඇති මුදල් | රු. ශ. | අතිරේක ප්‍රතිපාදයන් | රු. ශ. |
|---|---|---|---|
| ඩී (1) (එච්) කාණු කැපීම ... ... | 1,023 0 | ඒ 2 (ඊ) නීතිය පිළිබඳ වියදම් ... ... | 1,000 0 |
| | | ඒ 2 (එච්) ගණන් පරීක්ෂක ගාස්තු ... ... | 23 0 |
| | 1,023 0 | | 1,023 0 |

ඉ. නන්දිපාල,
සභාපති,
අහංගම සුළු නගර සභාව.

1965 ක්වූ අගෝස්තු මස 9 වැනි දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

8–793—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## දඹුල්ල සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40(2) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### වර්ෂ 1965 අය වැය ලේඛනයයි

වර්ෂ 1965 අයවැය ලේඛනයේ මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වා ඇති පරිදි මුදල් මාරු කිරීමට 1965 ජූනි මස 26 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී අංක 6 දරණ යෝජනාවෙන් සභා සම්මත කරගන්නා ලදී :—

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | රු. | ශ, |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. නිලධාරී වැටුප්— | | |
| (බී) ලිපිකරුවෝ ... ... ... | 900 | 0 |
| | 900 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. නිලධාරී වැටුප්— ... | | |
| (ඒ) ලේකම් ... ... ... | 150 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශන සහ මුද්දර ... | 850 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය : | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඇන්) මාතෘධාරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 400 | 0 |
| | 900 | 0 |

වී. ජී. උක්කුරාල,
සභාපති,
දඹුල්ල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දඹුල්ල, 1965 ජූලි මස 14 වැනි දින.

අනුමත කරන ලදී.

බී. ලියනමාන,
සහකාර පළාත් පාලන කොමසාරිස්.

1965.8.9 දින,
මාතලේදී ය.

8-773—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය

### අය වැය ලේඛනය, 1965

21.7.65 වැනි දින පැවැත් වූ සුළු නගර සභා රැස්වීමේ දී පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව සම්මත කර ගන්නා ලද පහත සඳහන් වැඩිපුර වැය ශීර්ෂයන් පිරවීම සඳහා වෙනත් ඉතිරි වැය ශීර්ෂයෝ:—

**ඉතිරිය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ. 2.කේ. කාර්යාලීය උපකරණ ... ... | 150 | 0 |
| සී. 10 සභා ගොඩනැගිලි–ඉඩම් අත්කර ගැනීම ... | 150 | 0 |
| ඩී. 5 එච්. ජල සම්පාදන–පොදු නාන ස්ථාන ... | 5,000 | 0 |
| ඩී. 7 ඇෆ්. පොදු වෙළඳ සැල්–ඉඩම් අත්කර ගැනීම ... | 3,000 | 0 |
| | 8,300 | 0 |

**වැඩිපුර**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ 2. බී. ලිපිකරු වැටුප් ... ... ... | 125 | 0 |
| ඒ 2 ඒ. දීමනා ... ... ... | 25 | 0 |
| ඒ 2 බී. ගමන් ගාස්තු ... ... ... | 300 | 0 |
| ඒ 2 ඇෆ්. ලිපි ද්‍රව්‍ය–මුද්‍රණ කටයුතු ... ... | 100 | 0 |
| ඒ 2 අයි. නිවාඩු දින දුම්රිය බලපත්‍ර ... ... | 150 | 0 |
| ඒ 2 ජේ. හදිසි වියදම් ... ... ... | 150 | 0 |
| ඩී 1 ඇන්. මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... ... | 200 | 0 |
| බී 12 අළුත් වැඩ ... ... | 7,000 | 0 |
| ජී 1 බල්ලන් විනාශ කිරීම ... ... | 250 | 0 |
| | 8,300 | 0 |

ඊ. විලී ආරියපාල,
සභාපති,
මොණරාගල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මොණරාගල,
28.7.65.

අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1965.8.6 දින,
පළාත් පාලන කාර්යාලය,
බදුල්ල.

8-789—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## දෙවිනුවර සුළු නගර සභාව

### අංක 40 (ii) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසිය යටතේ කෙරෙන ඉල්ලීමයි

### අය වැය ලේඛනය, 1965

පහත සඳහන් ඉතිරි වැය යටතේ සඳහන් ශීර්ෂයේ මුදල හා ඒ හා සමග දැක්වෙන අතිරේක වියදම් යටතේ සඳහන් ශීර්ෂයන්ට මාරුකර ඉන් වැය කිරීමට 1965.7.31 දින පවත්වන ලද සභා රැස්වීමේදී සම්මත කර ගන්නා ලදී:—

**ඉතිරි වැය**

| සාමාන්‍ය :— | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ජී) ජීවනාධාර ... ... ... | 200 | 0 |
| 2. කාර්යාල වියදම්— | | |
| (බී) ගමන් වියදම් ... ... | 200 | 0 |
| (සී) අයබදු අයකරන්නන්ගේ කොමිස් ... | 100 | 0 |
| (ජේ) හදිසි වියදම් ... ... | 60 | 0 |
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| 4. නඩත්තුව ... ... ... | 125 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 2. කුණු කසළ ශෝධනය— | | |
| (සී) ගබඩා බඩු ... ... ... | 100 | 0 |
| 3. වැසිකිළි ශෝධනය— | | |
| (සී) ගබඩා බඩු ... ... ... | 25 | 0 |
| ජේ.—කියවීම් ශාලා සහ පොත්ගුල් :— | | |
| 4. ලී බඩු ... ... ... | 150 | 0 |
| 5. නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| | 1,960 | 0 |

**අතිරේක වැය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (සී) ආදායම් පරීක්ෂක ... ... | 104 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 13. ජීවනාධාර (පරීක්ෂක) ... ... | 20 | 0 |
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| 8. ජීවනාධාර (මුරකරු) ... ... | 180 | 0 |
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 2. කාර්යාලීය වියදම්— | | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් සහ මුද්දර ... | 1,075 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 1. වැටුප් | | |
| (බී) පරීක්ෂක ... ... ... | 51 | 0 |
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| (1) වැටුප් (මුරකරු) ... ... | 75 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 1. සාමාන්‍ය.— | | |
| (සී) දීමනා (මහජන සෞඛ්‍ය පරීක්ෂක) ... | 120 | 0 |
| (එන්) මාතෘදාරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 100 | 0 |
| 3. වැසිකිළි ශෝධනය— | | |
| (ඊ) නඩත්තුව ... ... ... | 235 | 0 |
| | 1,960 | 0 |

**විදුලිය :—**

| | රු. | ශ. |
|---|---|---|
| 1. විදුලි බලය නිපදවීම— | | |
| (ඩී) විදුලි බලය මිලදී ගැනීම ... ... | 250 | 0 |
| 2. පිළියම් හා නඩත්තු— | | |
| (බී) යන්ත්‍ර හා මෙවලම් ... ... | 100 | 0 |
| (සී) මීටර් ආදිය ... ... ... | 200 | 0 |
| (ඩී) විදුලි මාවත් හා මූලනාලි නඩත්තුව ... | 250 | 0 |
| 4. පාලනය හා සාමාන්‍ය වියදම්— | | |
| (සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ... ... | 200 | 0 |
| | 1,000 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| 3. නිවෙස්වලට විදුලිබලය දීම— | | |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... | 1,000 | 0 |
| | 1,000 | 0 |

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර, 1965.8.9.

8-767—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## බලුමැන්ඩල්හි 6 වැනි පටුමග තැනීම

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදයේ (26 වැනි ඡේදය) යටතේ පිළියෙල කරන ලද ප්‍රාරම්භක වියදම් කොටස් කිරීම

1964 මැයි 29 වැනි දින අංක 14,046 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරණ ලද ප්‍රාරම්භක වියදම් කොටස් කිරීම සම්බන්ධව සහ සියළුම අයිතිකරුවන් වෙත භාරදෙන ලද අංක ඇම්.ඊ/ඩී.සී/පී.ඇස්.42/61 සහ 64.7.3 වෙනි දින දරණ දැන්වීම් ප්‍රකාර සහ ගෘහ සහ නගර සංවර්ධන ආඥපනතේ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදය 26 වෙනි ඡේදය යටතේ කොළඹ නාගරික සභාව, කොළඹ, බලුමැන්ඩල්හි 6 වෙනි පටුමග තැනීම සම්බන්ධයෙන් ලැබුන විරුද්ධත්වයන් සලකා බැලීමෙන් පසුව නාගරික කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද සංශෝධිත වියදම් කොටස් කිරීම අනුමත කර මෙහි පහත සඳහන් වැඩ සියල්ලක්ම හෝ ඉන් සමහරක් හෝ කිරීමට යෝජනා කරන්නීය.

(අ) දෙපැත්තේම අයිනට තණ පිඩැලි සහ අර්ධ කවාකාර කොන්ක්‍රිට් කාණුගල් යෙදූ, අඩි 18ක් පළලැති, අඟල් 4ක් ඝණට තාරදැමූ, විදුලි පහන් සහිතවූ රථ වාහන මාර්ගයක්, සහ

(ආ) කසල කාණුවක්

මෙම වියදම අයකරගනු ලබන්නේ අවුරුදු 10 ක කාලයක් ඇතුළතය. තවද මෙම වැඩ කිරීමේ වියදමින් කිසිම කොටසක්වත් නොදැරීමට නාගරික සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

මෙම වියදම කොටස් කර තිබෙන්නේ දැනට පවතින කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අනුව පිළියෙල කරන ලද ඇස්තමේන්තු උඩ හෙයින් නියම වශයෙන් වැඩ කරන කාලයේදී කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අඩුවැඩිවීමේ හේතුවෙන් මෙම වියදම් කොටස් කිරීමද වෙනස් විය හැකිය.

| තක්සේරු අංකය | වීදියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම | ලබාගැනීමට තිබෙන ඉඩම් වලට ගෙවිය යුතු වන්දිය | වියදම් කොටස් කිරීම |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 32 | වෝල් වීදිය | ජේ. ඒ. එන්. ප්‍රනාන්දු පුල්ලෙ, අංක 50, 6 වෙනි පටුමග, කොටහේන. | 4,818 08 | 460 0 | 4,358 08 |
| 34, 2, 4, 6 සහ 8 | වෝල් වීදිය සහ 6 වෙනි පටුමග | එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු, බී. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3. | — | 11,080 0 | — |
| 14 | වෝල් වීදිය | අංක 14 දරණ ස්ථානයෙහි අයිතිකරු, 6 වැනි පටුමග | 5,496 68 | — | 5,496 68 |
| 16 | එම | අංක 16 දරණ ස්ථානයෙහි අයිතිකරු, 6 වැනි පටුමග | 4,750 22 | — | 4,750 22 |
| 383 | බලුමැන්ඩල් පාර | ගරු අධ්‍යක්ෂක සහෝදර පියතුමා; ශාන්ත බෙනඩික් විද්‍යාලයය, වෝල් වීදිය, කොළඹ 13. | 6,107 42 | — | 6,107 42 |
| 57/1 | 6 වෙනි පටුමග | ඩබ්. ඇෆ්. ඇලස් සහ ඩී. ඇම්. ඇලස්, 49/6, 6 වෙනි පටුමග, කොළඹ 13. | 3,596 60 | — | 3,596 60 |
| 57/3 සහ 4 59 සහ 59/1 | එම | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3. | 10,179 07 | 800 0 | 9,379 07 |
| 49/1 | එම | එස්. පී. ඒ. කරුණාවතී, 49/1, 6 වෙනි පටුමග, කොළඹ 13. | 1,357 22 | — | 1,357 22 |
| 49/2-4 | එම | එම්. ඒ. ජේ. පෙරේරා සහ එස්. පී. ඒ. චන්ද්‍රාවතී, 203, පිකරින්ස් පාර, කොළඹ 13. | 4,071 62 | — | 4,071 62 |
| 49/5 | එම | ඒ. එම්. ජෝන්ගේ භාර්‍යාව වූ වීරසිංහ තියඩෝරා, ජාතික නිවාස යෝජනා ක්‍රමය, බ්ලොක් "ඒ", නො. 2, ආමර් වීදිය, කොළඹ 12. | 1,357 22 | — | 1,357 22 |
| 49/6 සහ 7 | එම | ඩබ්. එෆ්. ඇලස් සහ ඩී. ඇම්. ඇලස්, 49/6, 6 වෙනි පටුමග, කොළඹ 13. | 4,071 62 | — | 4,071 62 |
| 47/1 සහ 2 | එම | බාරොන් සිල්වා, 47/2, 6 වෙනි පටුමග, කොළඹ 13. | 4,682 36 | — | 4,682 36 |
| 45 (කැබලි 8 සහ 9) | එම | නො. 45 දරණ ස්ථානය අයිතිකරු, 6 වෙනි පටුමග | 5,496 92 | — | 5,496 92 |
| 25 | එම | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු, සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 13. | 4,410 92 | 2,500 0 | 1,910 92 |
| 50 | වෝල් වීදිය | පී. ජේ. ඩේවිඩ්, අංක 50, 6 වෙනි පටුමග, කොළඹ 13 | 6,514 63 | — | 5,614 63 |
| 50 ඒ | එම | ඒ. සිවයෝගනාතන්, අංක 50, 6 වෙනි පටුමග, කොළඹ 13. | 3,596 60 | — | 3,596 60 |
| 54, 56, 58 සහ 60 | එම | මැටිල්ඩා පෙරේරා විවාහයට පෙර වන්නකු වත්ත වඩුගේ මැටිල්ඩා ප්‍රනාන්දු, 19/3, 6 වෙනි පටුමග, වෝල් වීදිය, කොළඹ 13. | 3,935 90 | — | 3,935 90 |
| 64 | එම | එන්. ඒ. බබාපුල්ලෙ, 63, වෝල් වීදිය, කොළඹ 13. | 3,868 04 | — | 3,868 04 |
| 74 | එම | පලනි වඩිවේල් පුල්ලෙගේ භාර්‍යාවවූ කනගමාල් රාජු, 70, ග්ලෙනි වීදිය, කොළඹ 3. | 1,832 24 | — | 1,832 24 |
| 76 | එම | ඒ. ඊ. වාසගම්, අංක 76, 6 වෙනි පටුමග, කොටහේන | 1,696 52 | — | 1,696 52 |
| 78 | 6 වැනි පටුමග | එම්. හර්බට් පෙරේරා, 78, 6 වෙනි පටුමග, වෝල් වීදිය, කොළඹ 13. | 1,628 66 | — | 1,628 66 |
| 80 | එම | ලූර්දු මේරි වෙල්ලයියා, 38, ගල්පොත්ත වීදිය, කොටහේන, කොළඹ 13. | 1,900 10 | — | 1,900 10 |

| තක්සේරු අංකය | විදියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම | ලබාගැනීමට තිබෙන ඉඩම් වලට ගෙවියයුතු වන්දිය | වියදම් කොටස් කිරීම |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | |
| 80/1-5 | 6 වෙනි පටුමග | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3. | 3,393 02 | — | 3,393 02 |
| 82 සහ 84 | එම | ජෝන් ගුණරත්න, 49/5, 6 වෙනි පටුමග, කොළඹ 13. | 1,357 22 | — | 1,357 22 |
| 86, 88, 90, 92, 94 සහ 94/2 | එම | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3. | 4,750 22 | — | 4,750 22 |
| 94/1 සහ 96 | එම | එම | 1,492 94 | — | 1,492 94 |
| 98 | එම | එම | 1,153 64 | — | 1,153 64 |
| 100 | එම | එම | 1,628 66 | — | 1,628 66 |
| 110 | එම | එම | 2,782 28 | — | 2,782 28 |
| 11/1, 11/14, 11/2, 11/5 සහ 11/16 | එම | එම | 2,918 0 | — | 2,918 0 |
| 11/7 සහ 11/8 | එම | එම්. බාබරා පීරිස්, 11/8, 6 වෙනි පටුමග කොළඹ 13. | 746 48 | — | 746 48 |
| 11/17 සහ 11/18 | එම | කේ. බී. එඩ්මන්, 11/18, 6 වෙනි පටුමග, කොළඹ 13. | 4,750 22 | — | 4,750 22 |
| 11/3 සහ 11/4 | එම | රෝස් පෙරුමාල්, 67/1, ග්‍රෙගරි පාර, කොළඹ 7. | 746 48 | — | 746 48 |
| 36 | වෝල් විදිය | එච්. අයි. ආර්. එම්. පෙරේරා, 86/60, වෝල් විදිය, කොළඹ 13. | 5,225 24 | 880 0 | 4,345 24 |
| | | | 1,16,312 0 | 15,720 0 | 1,11,672 80 |

බ. ඔ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

නගර ශාලාව,
කොළඹ 7.
1965 ජූලි මස 20 වන දින.

8-791—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## වත්තේගම නගර සභාව

### නගර සභා අඥපනත

### 1965 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

නගර සභා ඈඥාපනතේ (255 වැනි අධිකාරයේ) 130 (බී) වගන්තිය යටතේ, අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කෙරෙන සීමාවන්ට හා අස්කිරීම්වලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින් හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ, ඉකුත් වූ වර්ෂයේ බල පැවැත්වෙමින් තිබුණ පරිදිම, වත්තේගම නගර සභා සීමාව තුළ තිබෙන සියලුම නිශ්චල දේපළවල වටිනාකමින් සියයට හයක විශේෂ ජල බද්දක් 1965 වර්ෂය සඳහා වත්තේගම නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි,
සභාපති,
වත්තේගම පළාත් ආණ්ඩු සභාව.

1965.8.5,
පළාත් ආණ්ඩු සභා කායර්‍ාලය,
වත්තේගම.

8–772—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය උප නගර සභාව

### ගොඝාතක ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින්, මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1965 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ බලපත්‍ර නිකුත් කිරීම ගැන, පුන්ඩලුඔය උප නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත දී, මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 272 වැනි අධිකාරය වන ගොඝාතක ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳමේ ස්වභාවය |
|---|---|---|
| (1) ඇම්. අයි. ඒ. කාදර්, ඉහළ කඩ වීදිය, පුන්ඩලුඔය | ඉහළ කඩ වීදිය, පොදු වෙළඳ සැල, පුන්ඩලුඔය | ගවමස් |

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
පුන්ඩලුඔය උප නගර සභාවේ සභාපති.

උප නගර සභා කායර්‍ාලය,
පුන්ඩලුඔය,
1965.8.14.

8—769—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## දූරණියගල ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන පලේඛනයෙහි සඳහන් අය විසින් හරක් මස් සහ එළු මස් විකිණීමට පමනක් 1965 වර්ෂයේ ඉදිරි කාලය සඳහා බල පත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව දූරණියගල ගම්සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුන සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වන දින සිට 14 දින ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ අංක. 7(2) දරණ 1947 අංක. 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ආර්. ඇම්. ඒ. රත්නසේකර,
දූරණියගල ගම්සභාවේ සභාපති තැනා.

ගම්සභා කායර්‍යාලය,
දූරණියගල,
1965.8.10

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| ඇම්. ඇම්. ෂරිප්දීන්, නො. 357/1, තල්දූව, අවිස්සාවේල්ල | වයි. පී. ඇස්. සමරසේකර, මහතාට අයත් පිදවිල්ලේ ඉඩම, දූරණියගල | හරක් මස් සහ එළු මස් |

8—778—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## නාත්තන්ඩිය සුළු නගරසභාව

**1965 වර්ෂය සඳහා වූ කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වගන්තිය යටතේ, අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කෙරෙන සීමාවන්ට හා අස්කිරීම් වලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දායින් අවසන්වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන සේ, ඉකුත්වූ වර්ෂයේ බලපැවැත්වෙමින් තිබුණ පරිදිම, නාත්තන්ඩිය සුළු නගරයේ 2, 3, 4 හා 7 යන ඡන්ද කොට්ඨාශ තුල පිහිටා තිබෙන, සියලුම, නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින්වූ කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් 1965 වර්ෂයට නාත්තන්ඩිය සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඇම්. තාහිර්,
වැඩ බලන සභාපති.

1965 අගෝස්තු 7 වන දිනදී,
නාත්තන්ඩිය, සුළු නගර සභා කාර්යාලයේදීය.

8–787—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන නිවේදන

**(607 වැනි පිට හා සම්බන්ධයි)**

ඇල්. ඩී.—බී 139/46

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ චුන්නාකම් සුළුනගර සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වැනි උපවගන්තිය අනුව පළ කරනු ලැබේ.

#### යෝජනාව

''(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වෙනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, මෙම සභාව විසින් එහි පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවත්වෙන (ආඥාපනතෙහි විස්තර කොට ඇති) විනෝද කටයුතු සඳහා ප්‍රවේශවීම පිණිස අය කරනු ලබන ගෙවීම්වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක්, මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

| අය කරනු ලබන මුදල | බදු ප්‍රමාණය |
|---|---|
| බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව.— | රු. ශ. |
| (අ) ශත 20කට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... ... | .05 |
| (ආ) ශත 50 කට වැඩි නමුත් රු. 1ට වැඩි නොවන විට ... | .10 |
| (ඇ) රු. 1කට වැඩි නමුත් රු. 1.50 කට වැඩි නොවන විට ... | .15 |
| (ඈ) රු. 1.50 කට වැඩි නමුත් රු. 2.කට වැඩි නොවන විට | .20 |
| (ඉ) රු. 2කට වැඩි නමුත් රු. 3කට වැඩි නොවන විට ... | .30 |
| (ඊ) රු. 3කට වැඩි නමුත් රු. 4කට වැඩි නොවන විට ... | .40 |
| (උ) රු. 4කට වැඩි නමුත් රු. 5කට වැඩි නොවන විට ... | .50 |
| (ඌ) රු. 5කට වැඩි නමුත් රු. 10කට වැඩි නොවන විට ... | 1.00 |
| (එ) රු. 10කට වැඩි වන විට— | |
| (1) පළමුවැනි රු. 10 ට ... ... | 1.00 |
| (2) එක් එක් අතිරේක රු. 5ට හෝ ඉන් කොටසකට | 1.00 '' |

ඇ. එ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිරලේකම්.

1965 ජූලි මස 29 වැනි දින,
කොළඹ දීය.

8–792—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට වැටෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි